# අපූරු මාලිමාව






අශ්මි මෙතුසරි බණ්ඩාර

# අපූරු මාලිමාව

ප්‍රථම එළිදැක්වීම - 2025.02.08
ISBN No : 978-624-208-781-8

අශ්මි මෙත්සරි බණ්ඩාර

# පිදුම

**මෙම පොත**
**මගේ ගුරු මෑණිවරුන්ට**
**හා පියවරුන්ට**
**පුදමු.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක කාලෙක සිටියා මාලා හා කසුන් කියලා ළමයි දෙන්නෙක්. ඔවුන් සිටියේ මුහුදු වෙරළක් ළඟ. ඒ දෙදෙනාට ගොඩක් යාළුවෝත් හිටියා. ඒ දෙන්නා හැමදාම සවසට මුහුදු වෙරළට යනවා සෙල්ලම් කරන්න. සමහර දවසට මුහුදේ ඔරුත් පදිනවා.






හවසට ඉර බැස යන හැටි බලන්න මාලායි, කසුනුයි හරිම කැමතියි. හැබැයි මේ දෙන්නා ටිකක් දඟයි. සමහර වෙලාවට අම්මයි තාත්තායි කියන දේ අහන් නැතිව ගිහිල්ලා තුවාල කරගෙනත් එනවා. ඔවුන්ගේ ගෙදර තිබුණේ මුහුදු වෙරළ ළඟමයි. මුහුදු වෙරළේ සිප්පි කටු අහුලන්න , වැලි මාළිගා හදන්න, මුහුදේ පීනන්න, මාළුත් එක්ක සෙල්ලම් කරන්න මේ දෙන්නා හරිම කැමතියි.

ඉතින් ඒ දෙන්නා මෙහෙම සතුටින් කල් ගෙවද්දි ඔවුන්ට හම්බුණා අපූරු මාලිමාවක්. ඒක හම්බ වුණේ මුහුදු වෙරළේ තිබිලා. මේ අපූරු මාලිමාව සමඟම කුඩා බොත්තමකුත් තිබුණා. මේ වගේ මාලිමාවක් මේ දෙදෙනා මීට කලින් දැකලා තිබුණේ නැහැ.






මේ මාළිමාව භාවිතා කරලා තිබෙන්නේ ඉස්සර කාලේ හිටපු මුහුදු මංකොල්ලකාරයෝ. ඔවුන් මෙය භාවිතා කර තිබෙන්නේ ඔවුන්ට අනතුරක් විමට යන විට ආපසු වේලාවෙන් ඉදිරියට හෝ පිටුපසට යෑමටයි. මාලායි කසුනුයි මේක දැන සිටියේ නැහැ. ඉතින් මේ දෙන්නා කිසිම දෙයක් සොයා බලන්නේ නැතිව ඒ මාලිමාවේ ඉදිරියට යනුවෙන් පෙන්වා ඇති ඊතළය ළඟ බොත්තම එබුවා. ඒකෙන් කියන්නේ ඔවුන්ට වේලාවෙන් ඉදිරියට යෑමට ඇති හැකියාවයි. ඔවුන් දෙදෙනා මෙම බොත්තම එබුව විට ඉතා දිප්තිමත් ආලෝකයක් ඇවිත් මේ දෙදෙනාම ඒ මාලිමාවට ඇදගත්තා.

මාලායි, කසුනුයි අන්තිමේට ම නතර වුණේ ඒ දෙන්නා කලින් හිටිය ලෝකයක. හැබැයි ඒ ගොල්ලෝ දැක්කා ඒ දෙදෙනාගේ යහළුවෝ හා ඒ දෙන්නාවම ! හැබැයි කවුරුත් මේ දෙන්නව අඳුරගත්තේ නැහැ. පස්සේ ඒගොල්ලන්ට තේරුණා ඔවුන් වේලාවෙන් ඉදිරියට ගිය ඇති බව.



ඔවුන් එතනට ආව මාලිමාවත් මාලාගේ අතේම තිබුණා. ඔවුන්ට තේරුණා මේ වෙන්න යන්නේ ඉදිරියට වෙන්න තිබෙන දේ කියලා. ඒ දෙන්නා දැක්කා මුහුදේ සෙල්ලම් කර කර ඉන්න ළමයි. සමහර අය පීනනවා, වැලි මාළිගා හදනවා, ඔරු පදිනවා, සිප්පි කටු අහුලනවා, සරුංගල් යවනවා. ඉතින් මේ අය මෙහෙම සතුටින් සෙල්ලම් කරද්දි ඔවුන් දකිනවා, එකපාරටම මුහුද ඇතුලට ඇද ගන්නවා.



එතකොට ඉස්සෙල්ලා මුහුද තිබුණු තැන ටිකක් හිස් වෙනවා. මාලාගෙයි, කසුන්ගෙයි සමහර යාළුවෝ එතනට ගිහිල්ලා ආයෙමත් පීනන්න පටන් ගත්තා. මාලාටයි, කසුන්ටයි පෙනුණේ ටික ටික මුහුද පොඩි වෙනවා වගෙයි.





ටික වේලාවක් ගත වුණා. එක පාරටම මේ දෙන්නා දැක්කා ඈතින් එන අති විශාල රැල්ලක්. මේ ගොල්ලො දැන ගත්තා මේ වෙන්න යන්නේ සුනාමියක් කියලා. ඒ විශාල රැල්ල තව තවත් ඔවුන් ඉන්න තැනට ළඟා වෙනවා. මාලායි කසුනුයි දැක්කා. මේක යහළුවන්ට කියන්න එතනට දිවුවා. ඒත් කවුරුත් ඒ දෙන්නව අඳුරගත්තේ නැහැ.

ඉතින් මේ දෙන්නා පුළුවන් තරම් ඉක්මනට අර මාලිමාවේ පිටුපසට යනුවෙන් පෙන්වා තිබෙන ඊතලය ළඟ ඇති බොත්තම එබුවා. ඉතින් අර කලින් වගේම දීප්තිමත් එළියක් ඇවිත් මේ දෙන්නව ඇදගෙන එගොල්ලෝ ඉස්සෙල්ලා හිටිය ලෝකයටම ගිහින් දැම්මා. මාලායි කසුනුයි එතැනින් ගොඩබැස්ස වෙලාවේදිම දුවලා ගිහින් තමන්ගේ අම්මාටයි තාත්තාටයි කියලා ඉක්මනටම ඒ වෙලාවේ මුහුදේ සෙල්ලම් කරමින් සිටි යහළුවන්ටත් කිව්වා. ඒ වෙනකොටත් අර සුනාමිය එන්න කලින් පහළ වුණු සළකුණු දැකගන්නට ලැබුණා.





ඊට පස්සේ මාලාගෙයි,කසුන්ගෙයි අම්මයි, තාත්තයි මේ ගැන කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුවට කියලා ඔවුන් එතන හිටපු මිනිසුන්ව ඉවත් කළා. මාලායි, කසුනුයි ඒ ගොල්ලන්ගේ යහළුවොත් දාගෙන ටිකක් මුහුදට දුර තැනකට ගියා. ටික වේලාවකින් ඒ එන්න තිබුණු සුනාමිය ආවා. මිනිස්සුන්ගේ ගෙවල් ගොඩක් විනාශ වුනාට ජීවිත ඔක්කොම වගේ බේරුණා.

මෙන්න මෙහෙමයි මාලාගෙයි, කසුන්ගෙයි ඒ වීර හපන්කම අවසන් වුණේ.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්